# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2000/80 - 2017 ජනවාරි මස 06 වැනි සිකුරාදා - 2017.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* .: 4/3/9/2013/WS/460.
*යොමු අංකය* .: 3/3/6/2/29.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන*ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරණ *ඉඩම් අත්කරගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ උඩතැන්න නව ජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්පත් කර ගැනීම.

*ලබාගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ/පරවශතාවේ විස්තර:*

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාතලේ උඩුසියපත්තුවේ උඩතැන්න ග්‍රාම නිලධාරි වසමේ වරාපිටිය ගමේ පිහිටි මාතලේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මු.පි.මා. 1687 දරණ පිඹුරේ සඳහන් හෙක්ටයාර් 0.0433 ක් වූ කැබලි අංක 01 දරණ ඉඩම.

01. කැබලි අංක 1
ඉඩමේ නම: රත්වත්තවත්ත; හිමිකම් කියන අය: ආර්. ආර්. යූ. කුරුප්පු, අංක: 30/1, උඩතැන්න, මාතලේ.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017.02.17 වැනි දින පෙරවරු 10.30 ට උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2017.02.09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී *ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලු හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වු ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඊ. ඩබ්. එන්. ඒ. එගොඩවෙල,
ප්‍රාදේශීය ලේකම්,
උකුවෙල.

2016 දෙසැම්බර් මස 23 වැනි දින,
උකුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-652

**ශුද්ධි පත්‍රිකාව**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* .: පා/ඉ/2/අත්/15.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* .: 4-3/6/2013/එච්ඩබ්/467.

මා විසින් 2016 දෙසැම්බර් මස 21 වැනි දින අංක 1998/24 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඉඩම් රජයට අත්පත්කර ගැනීම පිළිබඳ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි ලිපිලේඛන භාරදිය යුතු දිනය 2017.01.20 ලෙස සංශෝධන විය යුතුය.

තවද, 1 වන ඡේදයේ සඳහන් මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.9193 ක් ලෙස සංශෝධනය විය යුතුය. 461 සී - පහල පාදුක්ක ග්‍රාම නිලධාරි වසම්ද, ග්‍රාම නිලධාරි වසම් වලට ඇතුළත් විය යුතුය.

එස්. එච්. හේවගේ,
ප්‍රාදේශීය ලේකම්,
පාදුක්ක.

2017 ජනවාරි මස 05 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පාදුක්ක.

01-653

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.